පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# අවසාන වාර පරීක්ෂණය - 2017

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ...................................................
..............................................................................................................

කාලය : පැය 03 යි.

## යුරෝපා ඉතිහාසය II

**යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1989 දක්වා**

**සැලකිය යුතුයි :**

❖ **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

01. ඔබට සපයා ඇති සිතියමේ සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) කෝසිකා (ii) බෝල්ටික් මුහුද (iii) ක්‍රිමියාව

(iv) මැන්චෙස්ටර් (v) ටයිබර් ගඟ (vi) ප්‍රංශය

(vii) ඉංග්‍රීසි ඕඩය (viii) ඇතැන්ස්

**(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින් ද, කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 5 බැගින් ලැබේ)**

02. (i) ග්‍රීක පෞර රාජ්‍ය වල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(ii) ග්‍රීක ශිෂ්ටාචාරයේ ආගමික ඇදහිලි හා විශ්වාස මෙන් ම ග්‍රීක දර්ශනය පිළිබඳ ව විමසීමක් කරන්න. (ලකුණු 08)

03. "යුරෝපය නූතන යුගයට පරිවර්තනය වීමේ දී දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රබල ම සිදුවීමක් වූයේ ජාතික රාජ්‍යයන්ගේ නැගීමයි."

(i) යුරෝපයේ බිහි වූ මුල්ම ජාතික රාජ්‍ය තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) ජාතික රාජ්‍යයක සුවිශේෂී ලක්ෂණ සැකෙවින් පරීක්ෂා කරන්න. (ලකුණු 04)

(iii) ස්පාඤ්ඤය හෝ එංගලන්තය හෝ ජාතික රාජ්‍යයක් ලෙස වර්ධනය වීමේ දී එහි සිටි රජවරුන්ගේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 08)

04. "දේශ ගවේෂණ ව්‍යාපාරය යුරෝපයේ ආර්ථික ක්ෂේත්‍රයේ පමණක් නොව දේශපාලන ක්ෂේත්‍රයේ ද බොහෝ වෙනස්කම් ඇති කිරීමට සමත් විය."

(i) යුරෝපයේ දේශ ගවේෂණවලට මුල් වූ රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

Education NCP - www.edncp.lk

(ii) මුල් කාලීන ගවේෂණවලට අනුග්‍රහය දැක් වූ පාලකයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(iii) යුරෝපීය රටවල් විසින් සිදුකරන ලද මුල් කාලීන ගවේෂණ සැකෙවින් දක්වන්න. (ලකුණු 04)

(iv) ඉහත සඳහන් ප්‍රකාශය ඇසුරින් දේශ ගවේෂණ ව්‍යාපාරය තුළ ඇති වූ ආර්ථික හා දේශපාලන ප්‍රතිඵල සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06)

05. (i) කාර්මික විප්ලවය මුලින් ම ආරම්භ වූ කර්මාන්ත 03 නම් කරන්න. (ලකුණු 03)

(ii) කාර්මික විප්ලවය එංගලන්තයෙන් ආරම්භ වීමට තුඩු දුන් හේතු පරීක්ෂා කරන්න. (ලකුණු 04)

(iii) කාර්මික විප්ලවයේ බලපෑම ආර්ථික, දේශපාලන හා සමාජීය යන ක්ෂේත්‍ර තුළ වෙනස්කම් රැසක් ඇති කළේ ය. මේ පිළිබඳ ව විමසීමක් කරන්න. (ලකුණු 07)

06. "තිස් අවුරුදු යුද්ධය යුරෝපා ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස නම් කළ හැකි ය." මෙම ප්‍රකාශය පහත සඳහන් ක්ෂේත්‍ර ඇසුරින් විස්තර කරන්න.

(i) තිස් අවුරුදු යුද්ධය ඇතිවීමට තුඩු දුන් හේතු

(ii) තිස් අවුරුදු යුද්ධයේ ප්‍රධාන අවස්ථා

(iii) තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල

07. "ඇමරිකානු නිදහස් සටන ඇමරිකාවේ පමණක් නොව සමස්ත යුරෝපය තුළ ද දැඩි බලපෑමක් ඇති කළේ ය."

(i) ඇමරිකානු නිදහස් සටනේ සටන් පාඨය කුමක් ද? (ලකුණු 01)

(ii) ඇමරිකානු නිදහස් සටනේ නායකයා කවුරුන් ද? (ලකුණු 01)

(iii) උතුරු ඇමරිකාවේ බ්‍රිතාන්‍යයන් පිහිටි වූ ජනපද 04 ක් නම් කරන්න. (ලකුණු 01)

(iv) ඇමරිකානු නිදහස් සටන ඇතිවීමට තුඩු දුන් ආර්ථික හා දේශපාලන සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 02)

(v) ඇමරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06)

08. (i) නැපෝලියන් බොනපාට් උපන් දිවයින නම් කරන්න. (ලකුණු 01)

(ii) 1796 දී හා 1797 දී ඔහු ආක්‍රමණය කළ රටවල් 02 ක් නම් කරන්න. (ලකුණු 02)

(iii) නැපෝලියන් අංශ අධිරාජයා දක්වා බලවත් වූ ආකාරය කෙසේ සිදු වී දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) නැපෝලියන්ගේ දේශීය ප්‍රතිපත්තිය තුළ ප්‍රංශය නව මාවතකට ප්‍රවේශ වූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 07)

09. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(i) වැඩවසම් ක්‍රමය

(ii) පුනරුදය

(iii) හිම සමය

(iv) ප්‍රතිරෙපරමාදුව

(v) උත්ක්‍රෘෂ්ම විප්ලවය

Education NCP - www.edncp.lk



Education NCP - www.edncp.lk